ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය සභාව.
මාතලේ දිස්ත්‍රික්කය.
---------------------------------------

1 මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය 2014 මැයි 22 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 04 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 සැප්තැම්බර් 09 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය
-------

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයන් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**----------------------------------------**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**
**-------------------------------------------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

**(ආ)** ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කිරීමෙන් තොරව මිල දී ගනු ලබන ගබඩා තොග සෘජුවම වැය ශීර්ෂවලට හරකර තිබුණි.

### 1.3.3 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට ආදායම් විෂයයන් 04 ක් යටතේ ලැබිය යුතු රු.83,894 ක ආදායම් සහ දේශිය ණය සංවර්ධන අරමුදලට සහ විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.70,983 ක් ද ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ සභාව විසින් අවලංගු කරන ලද චෙක්පත්, වැඩිපුර ගෙවීම්, ආපසු ලැබීම් සහ අලාභයන් සම්බන්ධයෙන් අවස්ථා 05 ක දී අයකර ගෙන තිබුණු එකතුව රු.175,804 ක් වූ මුදල වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබියදීත්, ඒ ගැන නොසලකා එම අගය ලැබිය යුතු ශේෂයක් ලෙස ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඈ) සභා බල ප්‍රදේශයේ මගනැගුම යටතේ ක්‍රියාත්මක කර්මාන්ත 08 ක් සඳහා සභාවට ලැබිය යුතු හා සභාව විසින් කෝන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතුව තිබූ රු.4,000,000 ක් රු.400,000 ක් ලෙස ගිණුම්ගත කිරිම නිසා ණයගැති හා ණයහිමි ගිණුම් වල රු.3,600,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ අවසානයට මඩුමාන ජල ව්‍යාපෘතියට අදාළව ණයගැති හා ණය හිමි ශේෂ රු.16,890 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් අංක 11 අනුව මුදල් හා මුදල් වලට සමාන දෑ වල වටිනාකම රු.71,833 ක සෘණ ශේෂයක් වුවත්, එය වාසිදායක ශේෂයක් ලෙස ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කිරීම නිසා ජංගම වත්කම් රු.143,667 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) දේපල පිරියත හා උපකරණ ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධනට ආදායමෙන් දායක වීමේ ගිණුමේ ශේෂය අතර රු.4,146,848 ක වෙනසක් දක්නට ලැබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් සහ ශුද්ධ වත්කම් වෙනස් වීමේ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි.

### 1.3.4 නොසැසඳූ පාලන ගිණුම්

--------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.14,815,197 ක් වූ ගිණුම් විෂයන් 13 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තා වල දැක්වෙන ශේෂයන් අතර නිරීක්ෂණය වූ අසමානතා වල එකතුව රු.18,216,911 ක් විය.

### 1.3.5 අවිනිශ්චිත ගිණුම

ඉකුත් වර්ෂයේ අවසානයට වූ රු.1,838,725 ක බැර ශේෂයට සමාලෝචිත වර්ෂයේ දී තවත් රු.4,144 ක් බැර කර වර්ෂය අවසාන ශේෂය රු.1,842,869 ක් ලෙස දක්වා තිබුණු නමුත්, එම ශේෂයන් හදුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

#### (අ) ලැබිය යුතු ගිණුම් ශේෂ

2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.4,192,396 ක් වූ අතර, එම ශේෂයට ඇතුළත්ව තිබුණු වසරක කාලයක් ඉක්ම වූ ශේෂවල එකතුව රු.715,131 ක් විය.

#### (ආ) ගෙවිය යුතු ගිණුම් ශේෂ

2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.5,819.551 ක් වූ අතර, එම ශේෂයට ඇතුළත්ව තිබුණු වසරක කාලයක් ඉක්ම වූ ශේෂවල එකතුව රු.1,933,932 ක් විය. ඊට වර්ෂ 3ක කාලයක් ඉක්ම වූ රු.277,257 ක ශේෂ ද ඇතුළත්ව තිබුණි.

### 1.3.7 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයන් 09 කට අදාල එකතුව රු.5,000,066 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.8 නීති, රිති රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත විස්තර දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) <u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත</u>** | |
| **(i)** 170 වගන්තිය | සභාපතිවරයාගේ අනුමැතිය ලබානොගෙන සමාලෝචිත වර්ෂය තුල අවස්ථා 11 කදී රු.1,100,800 ක් වියදම් ශීර්ෂ අතර මාරු කර තිබුණි. |
| **(ii)** 175 (1) වගන්තිය | පළාත් පාලන කොමසාරිස්වරයාගේ තීරණයක් ලබානොගෙන අනියම් , ආදේශක හා දෛනික පදනම මත සේවයට යොදවා ගත් සේවකයින් 12 දෙනෙකුට රු.1,420,400 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |
| **(ආ) <u>ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 වගන්තිය</u>** | ණය ගෙවීම් පැහැර හරින ලද සේවකයින් තිදෙනෙකුගෙන් අය විය යුතුව තිබුණු එකතුව රු.133,695 ක් වූ ණය ශේෂ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| **(ඇ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u>** | |
| **(i)** මුදල් රෙගුලාසි 261 (3) | යොමුගත විධිවිධාන වලට අනුකූල නොවී චෙක්පත් නිකුත් කිරිම නිසා වර්ෂය අවසානයට මුදල් පොතේ රු.71,900 ක සෘණ ශේෂයක් උද්ගත වි තිබුණි. |
| **(ii)** මුදල් රෙගුලාසි 395 | දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව වසරකට අධික කාලයක් තිස්සේ හඳුනා නොගත් එකතුව රු.19,222 ක් වූ ශේෂ 05 ක් නිරවුල් කිරිමට පියවර ගෙන නොතිබුණි. |
| **(ii)** මුදල් රෙගුලාසි 756 | 2014 මැයි 31 වන විටත් සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. |

**1.3.9 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

1997 මැයි මස සිට 2012 ඔක්තෝබර් මස දක්වා කාල පරිච්ඡේදයට අදාළව සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායක මුදල් වලට අදාළ වාර්තා නොයැවීම නිසා රු.5,533 ක අධිභාර මුදලක් සභා අරමුදලින් ගෙවීමට සිදු වී තිබුණි.

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(අ)** විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ වියදම රු.2,643,943 ක් වූ අතර, ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.2,924,092 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,568,035 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

**(ආ)** වැඩ සටහන් අනුව ආදායම් හා වියදම් සසඳා බැලීමේ දී අංක 01, 04 සහ 05 දරන වැඩ සටහන් හැරුණු විට අනෙකුත් වැඩ සටහන් 03 හිම ආදායම් ඉක්ම වූ වියදම් දක්නට ලැබුණි.

**2.2 විග්‍රාහත්මක මූල්‍ය සමාලෝචනය**

2012 වර්ෂයට වඩා සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය අඩු වී තිබුණු අතර ජංගම වගකීම් ආවරණය කිරීම සඳහා ජංගම වත්කම් පැවතියත් එය ප්‍රමාණාත්මක මට්ටමක නොපැවතුණ බව නිරීක්ෂණය විය.

## 2.3 ආදායම් පරිපාලනය
---------------------

**ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය**
--------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

**(අ) බදුකුලී**
--------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟ බදුකුලී සහ වර්ෂය සඳහා බිල් කල ආදායම සමග එකතු කළයුතු ආදායම රු.1,607,182 ක් වුවද, ඉන් අයකර ගෙන තිබුණේ රු.805,047 ක් හෙවත් සියයට 50 ක් පමණි.

**(ආ) ජල ගාස්තු**
------------

සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ ජල ගාස්තු සහ වර්ෂය සඳහා බිල් කල ආදායම සමග එකතු කළ යුතු ආදායම රු.952,965 ක් වුවද, ඉන් අයකර ගෙන තිබුණේ රු.528,608 ක් හෙවත් සියයට 55 ක් පමණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු බොලරෝ වර්ගයේ රථය රු. 265,425 ක වියදමින් අලුත්වැඩියා කර තිබුණු නමුත් ඊට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9:3:1 (අ) වගන්තිය ප්‍රකාරව අමාත්‍යංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. එමෙන්ම අලුත්වැඩියාව සාර්ථකව සිදුකර ඇති බව තහවුරු කෙරෙන ඉංජිනේරු සහතිකයක් නොමැතිව ගෙවීම් සිදු කර තිබුණි.

(ආ) මිල ගණන් කැඳවා ගරාජයන් තෝරා නොගෙන සමාලෝචිත වර්ෂය තුළ කැබ් රථයක් රු.98,700 ක වියදමක් දරා අලුත්වැඩියා කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සභාව විසින් ධාවනයට යොදාගන්නා කැබ් රථය, යතුරුපැදි 02 ක් සහ කුබෝටා ට්‍රැක්ටරයේ අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ආදායම් බලපත්‍ර ලබා නොගෙන සභාව සතු ට්‍රැක්ටර් 02 ක් සහ ජීප් රථය ධාවනය සඳහා යොදවා ගෙන තිබුණු අතර, ට්‍රැක්ටරය සහ ටේලරයක් සඳහා රක්ෂණ ආවරණද ලබාගෙන නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 42 ක් වුව ද, ඉන් 20 ක් පුරප්පාඩු පැවතීම සහ සුදුසුකම් සම්පූර්ණ කර ඇති ලේකම්වරයෙකු පත්කර නොතිබීම හේතුවෙන් සභාවේ කටයුතු කාර්යක්ෂමව කරගෙනයාම කෙරෙහි අහිතකර බලපෑම් උද්ගත වී තිබුණි.

(ඊ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 52 වගන්තිය ප්‍රකාරව අනවසර ඉදි කිරීම් 11ක් සම්බන්ධයෙන් සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(උ) 1993 සැප්තැම්බර් 03 දිනට ප්‍රථම විශ්‍රාම ගන්වන ලද සේවකයින් වෙනුවෙන් පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට අඛණ්ඩව දායක මුදල් නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂයේ අවසන් වන විට ගෙවිය යුතු ශේෂය රු.2,003,715 ක් තරම් ඉහළ අගයක් වී තිබුණි.

## 3.2 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

එකතු වටිනාකම රු.664,300 ක් වූ වත්කම් ඒකක 03 ක් සහ වටිනාකම ගණනය කර නොමැති වත්කම් ඒකක 04 ක් නිෂ්ක්‍රීයව හෝ ඌණ උපයෝජිතව වසර හතරකට වැඩි කාලයක් තිස්සේ පැවතුණි.

## 3.3 ආර්ථික නොවූ ගනුදෙනු

ජාතික සවිය මඟ නැගුම යෝජනා ක්‍රමය යටතේ රු.1,400,000 ක වියදම් දරා 2011 දෙසැම්බර් 29 දින වැඩ නිම කර තිබූ කිවුලේවාඩිය ජල ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය අවසන් වන විට ද ජලය නොමැතිකමින් ක්‍රියාත්මක නොවන තත්ත්වයේ පැවතුණි.

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ). සමාලෝචිත වර්ෂය තුළ සභාව විසින් පිරිනමා තිබුණු කොන්ත්‍රාත් 07 කට අදාළ එකතුව රු.3,496,500 ක් වූ ගෙවීම් කිරීමේ දී කොන්ත්‍රාත්තුව වෙනුවෙන් ගිවිසුම් ඇතිකරගෙන තිබුණු සමෘද්ධි සමිතියේ ලේකම්ගේ නමට චෙක්පත් නිකුත් නොකර, එම ප්‍රදේශයේ සමෘද්ධි බැංකුවේ කළමණාකරුගේ නමට චෙක්පත් ලියා නිකුත් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් ඉටු කරන ලද කර්මාන්ත සම්බන්ධව ඇස්තමේන්තු සකස් කිරීම, මිනුම් වාර්තා ලබා ගැනීම, පරීක්ෂා කිරීම, ගෙවීම් නිර්දේශ කිරීම යන සියලුම කාර්යයන් සභාවේ තාක්ෂණ නිලධාරී විසින් පමණක් ඉටු කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ සභාව විසින් මහ නැගුම ව්‍යාපෘතිය යටතේ ඉටු කරන ලද කර්මාන්ත 07 ක් වෙනුවෙන් රැදවුම් මුදල් තබා නොගෙන සම්පූර්ණ මුදලම නිදහස් කර තිබුණි.

**3.5 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

---

සභා බල ප්‍රදේශයේ කසළ බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, එකතු වන කසළ වෙන් කිරීමකින් තොරව සභාවේ ට්‍රැක්ටරයක් යොදාගෙන බලගොල්ලයාය ප්‍රදේශයේ පිහිටි විවෘත භූමියකට බැහැර කර තිබුණි. කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩ සටහන් සඳහා සභාවේ අවධානය යොමු විය යුතුව ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---

**4.1 අයවැය පාලනය**

---

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛණයේ ආදායම් ශීර්ෂ 12ක් යටතේ රු.4,908,468 ක ආදායම් උපයා ගැනීමට ඇස්තමේන්තු කර තිබුණ නමුත් ඉන් කිසිදු ආදායමක් උපයාගෙන නොතිබුණි. තවත් ආදායම් ශීර්ෂ 03 ක අය කිරීම් ප්‍රතිශතය සියයට 10 ත් සියයට 35 ත් අතර මට්ටමක පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය වේ.

**4.2 නොවිසඳී ඇති හා පිළිතුරු නොලත් විගණන විමසුම්**

---

සමාලෝචිත වර්ෂය අවසාන වන විට සභාව වෙත ඉදිරිපත් කරන ලද විගණන විමසුම් වලින් 08 ක් සඳහා පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම් වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.542,706 ක් විය.

**5 පද්ධති හා පාලන**

---

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

**(අ)** අයවැය පාලනය

**(ආ)** හිඟ ආදායම් අය කර ගැනීම

**(ඇ)** ණයගැති හා ණයහිමි පාලනය

**(ඈ)** මූල්‍ය පාලනය

**(ඉ)** ගබඩා පාලනය